# සමාජ ජාල හා වර්තමාන පුද්ගල සම්බන්ධතා

**කේ. ඒ. ඩී. එල්. වයි. එම්. සේනාපාල**[1]

**සංක්ෂේපය**

තාක්ෂණයේ දියුණුවත් සමඟ සන්නිවේදනය යන්න ඉතාමත් සරල ක්‍රියාවක් බවට පත් වූයේ, ලොව දෙතැනක සිටින පුද්ගලයන් මුහුණට මුහුණ බලා සජීවී රූප රාමු දෙනෙතට ගෙන ඒමත් සමඟයි. දුර සිටින පුද්ගලයන් සමීප කරමින් ළඟ සිටින පුද්ගලයන් දුරස් වන සමාජ විපර්යාසයන්, සදාචාරාත්මක හා සාරධර්ම පිළිබඳ ගැටලු සන්නිවේදන මාධ්‍යයේ අතුරු ඵලයන් ලෙස බිහිවෙමින් පවතී. එයින් සමාජ ජාල දියුණු වීමත් සමඟ පුද්ගල සබඳතා බිඳවැටීම වර්තමානයේ දැකිය හැකි ප්‍රධාන ගැටලුවකි. සමාජ ජාල භාවිතය හා එය පුද්ගල සම්බන්ධතා කෙරෙහි ඇති කරන බලපෑම අධ්‍යයන අරමුණු කරගනිමින් අන්තර්ජාලය හරහා සමාජ ජාල භාවිතා කරන්නන් 50 දෙනෙකු හට ප්‍රශ්නමාලාවක් ලබා දී තොරතුරු ලබා ගන්නා ලදී. පැය 2-6ත් අතර 72%ක් අන්තර්ජාලය භාවිතා කරන අතර පැය 10ක් භාවිතා කරන අය 16.3% කි. විනෝදාංශයක් ලෙස හා දැනුම සොයා ගැනීමට විශාල පිරිසක් අන්තර්ජාලය භාවිතා කරන අතර කාලය ගෙවා ගැනීමට හා පුද්ගලයන් මඟ හැරීමට 37% ක් වැනි විශාල පිරිසක් අන්තර්ජාලය භාවිතා කරයි. දෙමව්පියන් සමඟ අවමය පැය 1ක් ගත කරන පිරිස ඉතාමත් ඉහළ අගයක් ගන්නා අතර දෙමව්පියන්ට සාපේක්ෂව මිතුරන් සමඟ වැඩි වේලාවක් ගත කරයි. මානසික නිදහස හා පවුල් ගැටලු නිසා බොහෝ දෙනා දෙමව්පියන් මිතුරන්ගෙන් වෙන්ව සමාජ ජාලයන්හි කාලය ගත කිරීමට පුරුදු වී සිටින අතර 83.8% කට පමණක් එය සාර්ථක පිළිතුරක් වී තිබේ. 72% ක් සමාජ ජාල නිසා පුද්ගල සබඳතා බිඳී යන බව පිළිගන්නා අතර 74.4% ක් මෙය වෙනස් විය යුතු බව අවධාරණය කරයි. සමාජ ජාලයන්ට තම ගැටලු විසඳීමට ඉඩ ලබා නොදී ස්වයං පාලනය හා තම තමාගේ සීමා හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වන අතර ම ආකල්පමය වශයෙන් විශාල වෙනසක් සිදු විය යුතුය. පුද්ගල සම්බන්ධතාවයන්ගෙන් මිදී සමාජ ජාලයන්හි කාලය ගත කිරීමට තරුණ පරපුර උත්සාහ දරන අතර දරුවන් දෙමාපියන්ගෙන් දුරස් වීම මෙම පර්යේෂණය මඟින් නිගමනය වේ.

**මුඛ්‍ය පද :** සමාජ ජාල, අන්තර්ජාලය, පුද්ගල සම්බන්ධතා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yashiyashoda94@gmail.com